16

# ගන්ධාරයෙන් හමු වී ඇති බුදුන් වහන්සේ නිරූපිත කැටයම්වල මානවතත්වාරෝපිත ලක්ෂණ

*එච්. ඒ. එන්. ලක්මාලි* [1]
HU/2012/0393

බුදුන් වහන්සේගේ රුව ප්‍රථම වරට මානවතත්වාරෝපිත අකාරයෙන් කැටයම් අතරට එක් කර ගනු ලැබුවේ කණිෂ්ක රජු යටතේ වර්ධනය වු ගන්ධාර කලා සම්ප්‍රදායේදී ය. ගන්ධාරයන්ට පෙර කැටයම් නිර්මාණය කළ සාංචි, භාරුත් ආදී කලාකරුවන් බුදුන් වහන්සේගේ රුව දැක්වූයේ බෝධිය, ඡත්‍රය, සිරිපතුල, වජ්‍රාසනය ආදි සංකේත අනුසාරයෙනි. මේ නිසා එම සෑම කලා සම්ප්‍රදායක් යටතේම නිර්මාණය වූකැටයම් අතර බුදුන් වහන්සේගේ රුවමානව රූපකායෙන් දැක්වීමට අපොහොසත් වුව ද ගන්ධාර ශිල්පීන් එය බණ්ඩනය කිරිමට සමත් විය. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වන්නේ ගන්ධාර කලා සම්ප්‍රදායෙන් හමු ව ඇති බුදුන් වහන්සේ නිරූපිත කැටයම්හි මානවතත්වාරෝපිත ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ගන්ධාර කැටයම් අතර බුද්ධ චරිතය හා සම්බන්ධ විවිධ අවස්ථා කැටයමට නගා ඇත. ඒ අතර සිදුහත් කුමාරෝත්පත්තිය, ගිහිගෙය හැර යාම, ප්‍රථම ධර්ම දේශනය, මාර පරාජය, ප්‍රථම නියත විවරණය යනාදිය වැදගත් වේ. මේ වැනි සියලුම අවස්ථා කැටයමට නැගිමෙදි බුදුන් වහන්සේ මනවතත්වාරෝපිතව දැක්විමට සමත් වී ඇති අතර ඒ සෑම කැටයමකම කුෂාණයන් පෙර තමන්ට හුරුව සිටි ග්‍රීක, රෝම, පර්සියන් ආදි කලා සම්ප්‍රදායන්ගේ අභාසයට නතුව බුදුන් වහන්සේගේ රූපකාය නිරූපනය කිරීමට සමත්ව ඇත. බුදුන් වහන්සේගේ චීවරය නිර්මාණය කිරීමෙදි ග්‍රික,රෝම දේවිවරුන්ගේ සහ ප්‍රභූවරුන් භාවිතා කරන ලද ටෝගාවට සමානවන අයුරින් දක්වා ඇත. බුදුන් වහන්සේගේ මුහුණෙහි උග්‍ර හැගිම් ප්‍රකාශනයක් දක්වා ඇති අතර එය රෝම මුර්ති කලාවෙන් ලත් ආභාසය වේ. බුදුන් වහන්සේගේ හිසකෙස් සහ මුහුණ දැක්විමෙදි ග්‍රීක ඇපලෝ දෙවියන්ට සමාන ලෙස දක්වා ඇත. ගාන්ධාර කැටයම්කරුවා බුදුන් වහන්සේ නිරූපනය කර ඇත්තේ හුදෙක් උන්වහන්සේ සතු වු මහා කරුණාව නිරූපණය වන ආකාරයට නොව උන්වහන්සේ සතු මහා පෞරුෂය විදහාපාන ලෙසිනි. සිදුහත් කුමරු නිරූපණය කිරීමේදි පවා ගාන්ධාර කැටයම්කරුවා මහා ප්‍රාතිහාර්ය බලයක් සහිත පුද්ගලයකු ලෙස දක්වා ඇත. බුදුන් වහන්සේ පරිවාර පිරිස් සහිතව දක්වමින් ද පරිවාර පිරිසට වඩා උන්වහන්සේගේ රූපකාය විශාලව දක්වමින් උන්වහන්සේ සතු උත්තරිතර බව නිරූපනය කිරිමට සමත්ව ඇත. ගන්ධාර කැටයම්කරුවා බුදුන් වහන්සේ රුව මානවකායෙන් යුතුව නිරූපණය කළ ද උන්වහන්සේ සතු අධ්‍යාත්මික ගුණ සමුදාය සාර්ථකව දැක්විමට සමත් නොවු නිසා සාමන්‍ය ජනයා බලාපොරොත්තු වු දෙය සාර්ථකව ඉටු කිරිමට ගන්ධාර කැටයම්කරුවාට නොහැකි විය.

ප්‍රමුඛ පදඃ බෞද්ධාගමික කැටයම්, ගාන්ධාර කැටයම්, කුෂාණ යුගය, බෞද්ධාගමික සංකේත

*1 දෘශ්‍යකලා සැලසුම්කරණය (විශේෂවේදී) දෙවන වසර*